**2021 නොවැම්බර් මස 23 වන දින පැවති**

**හතළිස් තුන්වන මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව**

**දිනය :-2021.11.23**

**ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

**වේලාව :- පෙ.ව 10.00**

**සහභාගී වූ :-**

| | | | |
|---|---|---|---|
| **01.** | ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **02.** | ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **03.** | ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **04.** | ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **05.** | ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **06.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **07.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **08.** | ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **09.** | ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **10.** | ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **11.** | ගරු මන්ත්‍රී | ආර්.එම් කුමාරසිංහ මැතිතුමා | ( එ.ජා.ප) |
| **12.** | ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **13.** | ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය | ( එ.ජා.ප) |
| **14.** | ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණී බංඩාර මැතිනිය | ( එ.ජා.ප) |
| **15.** | ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **16.** | ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **17.** | ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **18.** | ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා | (ස්වාධීන කණ්ඩායම) |

**දන්වා සහභාගී නොවූ:-**

| | | | |
|---|---|---|---|
| **19.** | ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **20.** | ගරු මන්ත්‍රී | එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා | ( එ.ජා.ප) |
| **21.** | ගරු මන්ත්‍රී | ජී.ඒ නෙළුම් මැතිනිය | ( එ.ජා.ප) |

**නිළධාරීන්:-**

**01.** ලේකම් බී.එච් ප්‍රදීප් නිශාන්ත මයා

**02.** විෂය භාර කළමණාකරන සේවා නිළධාරී අයි.ජී.සී.නයෝමී වීරකෝන් මිය

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදෑසනක් ප්‍රාර්ථනය කරමින්, ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.**

**<u>2021.10.22 මහ සභා කෙටුම්පත් වාර්ථාව</u>**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2021.10.22 වන දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ අඩුපාඩු ඇත්නම් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2021.10.22 මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා</u> 2021.10.22 දින පැවති මහ සභාවේ කෙටුම්පත් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> අද දින පැවැත්වීමට නියමිත සභාව සඳහා කැඳවීම් කරන ලද ලිපියේ දිනය 2021.11.1 ලෙසට සඳහන් කර තිබීම මත නීත්‍යානුකූල නොවන සභාවක් කැඳවා ඇති බැවින් වෙනත් දිනයක මෙම සභාව පැවැත්වීමට කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

තවද නිවාඩු දින හැර වැඩ කරන දින 04 කට පෙර සභා වාර්ථාව හා න්‍යාය පත්‍රය ඇතුළුව අනෙකුත් වාර්ථා ලැබිය යුතු වුවත්, එසේ නොලැබීම තුල එය ද නීත්‍යානුකූල නොවන බව සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> කිසියම් හේතුවක් මත කලින් සම්මත කරන ලද දිනයේ නොපවත්වා මහ සභාව කල් තබන්නේ නම් ඒ සඳහා සභා අනුමැතියක් ලබා ගත යුතු බවට සඳහන් වන බවත්, දිගින් දිගටම පැමිණි නිවාඩු දිනයන් හා වාර්තා 02 ක් සකස් කිරීමට ප්‍රමාද වීම ආදී ප්‍රායෝගික ගැටළු මතු වීම තුල මෙලෙස යම් ප්‍රමාදයක් සිදු වූ බවටත්, කැඳවීමේ ලිපියේ දිනය ලෙසට 1 සටහන් වීම මුද්‍රණ දෝෂයක් මත සිදු වූවක් බව පිළිගන්නා බවත්, තිබූ යතාර්තය තුල මෙම සභාව පැවැත්විය යුතු වූ නමුත් ගරු සභිකවරුන් විසින් මෙම සභාව නීත්‍යානුකූල නැත යන්න ප්‍රකාශ කරමින් දිනය කල් දමනවානම් හෝ සභා සම්මතියක් රැගෙන අද දිනම මෙම රැස්වීම පවත්වනවානම් ඒ සඳහා වන බලය සභාව සතු වන බැවින් ඒ සම්බන්ධයෙන් යෝජනා ස්ථිරත්වයක් ලබා ගන්නා ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදී.

<u>ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමා</u> 2022 අයවැය වාර්ථාව සම්මත කිරීම සඳහා යෝජනාවක් න්‍යාය පත්‍රයේ ඇතුලත් කර ඇති නමුත්, සංශෝධිත අයවැය වාර්ථාව අද දින ලැබුණු බැවින් ඒ තුල පවතින සංඛ්‍යාමය දත්ත පරීක්ෂා කිරීමට කාලයක් නොලැබුණු බැවිනුත් හා කැඳවීම පිළිබඳවද ගැටළුවක් පවතින බැවින් මහ සභාව දින 2,3 ක් ඉදිරියට කල් තැබීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

තවද ගියවර විශේෂ මහ සභාවේදී කෙටුම්පත් අයවැය සාකච්ඡාව සඳහා පැමිණෙන ලෙසට දන්වා ඇතත්, එය සම්මත කිරීමකට යාම වැරදි ක්‍රියාවක් වන බැවින් 2022අයවැය සම්බන්ධව අදහස් දැක්වීමට අවස්ථාව හිමි විය යුතු බව සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> සභාව කෙදිනකට කල් දැමුවද අයවැය සම්බන්ධයෙන් සංශෝධන ඉදිරිපත් කිරීම සඳහා නැවත අවස්ථාවක් ලබා නොදෙන බව පැවසීය.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> පවතින මුද්‍රණ දෝෂයන් හා ප්‍රායෝගික තත්වයන් මත වාර්තා ලැබීම් ප්‍රමාද වුවද අද දින සභාව පවත්වාගෙන යාම කල යුතු කාර්යයක් වන බැවින් හා බහුතරයක් සහභාගි වී ඇති හෙයින් වෙනදා පරිදි අද දින සභාව ඉදිරියට පවත්වාගෙන යාම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා කැඳවීමේ ලිපියේ දිනය වෙනස් වූවාට එහි සභාව පැවැත්වෙන දිනයේ වෙනසක් සිදු වී නොමැති බැවින් හා අයවැය කෙටුම්පත සාකච්ඡා කිරීම හෝ සම්මත කිරීම වෙනුවෙන් කිසියම් දිනයක් වෙන් කර කැඳවීම සිදු කලත් එදින නොපැමිණ මෙලෙස අයවැය වෙනුවෙන් අවස්ථාව ඉල්ලීම සුදුසු නොවන බව ප්‍රකාශ කරමින් ගරු උප සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා 2022 අයවැය සම්මත කිරීම හා අද දින පැවැත්වෙන සභාව නීත්‍යානුකූල නොවන බැවින් එළබෙන අඟහරුවාදා දින මහ සභාව කැඳවා 2022 අයවැය විවාදය පවත්වා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අද දින සභාව ඉදිරියට පවත්වාගෙන යාම සම්බන්ධව යෝජනාවක් ඉදිරිපත් වී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් ඡන්දය විමසීම සිදු කරන ලෙස ලේකම්තුමා වෙත ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව ලේකම්තුමා විසින් ඡන්දය විමසීම සිදු කරන කල අතර 2021.11.23 වන දින මහ සභාව ඉදිරියට පවත්වාගෙන යාම සුදුසු බවට ගෙන ආ යෝජනාවට පක්ෂව ඡන්ද 11 ක්ද විපක්ෂව ඡන්ද 07ක්ද හිමි වූ අතර වැඩි ඡන්ද 04 කින් මහ සභව තව දුරටත් ඉදිරියට කරගෙන යාමේ යෝජනාව සභා සම්මත විය.

| | | | |
|---|---|---|---|
| **ගරු සභාපති** | **එස්.බී කුමාරදාස මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)** | **- පක්ෂයි** |
| **ගරු උප සභාපති** | **එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)** | **- පක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **බී.බී.ර් ගයාන් චාමර මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)** | **- පක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **කේ.ඒ ශාන්ත මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)** | **- පක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **කේ.ඒ සංජීව මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)** | **- පක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)** | **- පක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **ජේ.ඒ ජයවර්ධන මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)** | **- පක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)** | **- පක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)** | **- පක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **පී.ටී සිරිසේන මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ)** | **- පක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **ආර්.එම් කුමාරසිංහ මැතිතුමා** | **(එ.ජා.ප)** | **- විපක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **ඩී.පී බන්දුලසේන මැතිතුමා** | **( ශ්‍රී.ල නි.ප)** | **- විපක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය** | **( එ.ජා.ප)** | **- විපක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **ඩී.එම්.එන් සුභාෂිණි බංඩාර මැතිනිය** | **( එ.ජා.ප)** | **- විපක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **පී කරුණාරත්න මැතිතුමා** | **( ශ්‍රී.ල නි.ප)** | **- විපක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා** | **( ජ.වි.පෙ)** | **- විපක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **කේ. හැරිසෙන්ස් මැතිතුමා** | **( ජ.වි.පෙ)** | **- විපක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා** | **(ස්වාධීන කණ්ඩායම)** | **- පක්ෂයි** |

සංශෝදන

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා 2021.10.22 මහ සභා වාර්ථාවේ ලෝකයේ සිටි ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකු වන **බර්ටෝල් බ්‍රේස්ට්** යන ප්‍රකාශය ජොෂ්ඨ පුද්ගලයෙකු වන **බර්ටෝල් බ්‍රේස්ට්** ලෙසට සඳහන් වීම සංශෝධනය විය යුතු බවත්, වාර්ථාව තුල විෂමාචාර නොවන ක්‍රමදෝෂ දිගින් දිගටම පවතින බැවින් ඒ සියල්ල සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

ඒ අනුව 2021.10.22 වන දින පැවති මහ සභා කෙටුම්පත් වාර්තාව ඉදිරිපත් වූ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

## <u>2021.11.05 විශේෂ මහ සභා කෙටුම්පත් වාර්ථාව</u>

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2021.11.05 වන දින පැවැත් වූ විශේෂ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ අඩුපාඩු ඇත්නම් සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2021.11.05 විශේෂ මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලද අතර එම වාර්ථාව තුල සිදු කරනු ලැබූ ඡන්ද විමසීම සම්බන්ධයෙන් තොරතුරු සඳහන් නොවන බැවින්,පහත සඳහන් සටහන ඇතුලත් වී සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

<u>සංශෝදන</u>

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2022 වර්ෂය වෙනුවෙන් සකස් කල අයවැය කෙටුම්පත සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කර ගැනීමේ යෝජනාව වෙනුවෙන් ඡන්දය විමසන ලෙස ලේකම්තුමා වෙත ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව ලේකම්තුමා විසින් ඡන්දය විමසන ලද අතර යෝජනාවට පක්ෂව ඡන්ද 10 ක් හිමි විය. විපක්ෂව කිසිවෙකු ඡන්දය ප්‍රකාශ නොකල අතර ගරු මන්ත්‍රී දෙපලක් සභා ගර්භයේ සිටියේ නැත. ඒ අනුව 2022 අයවැය කෙටුම්පත සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

| | | |
|---|---|---|
| **ගරු සභාපති** | **එස්.බී කුමාරදාස මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) - පක්ෂයි** |
| **ගරු උප සභාපති** | **එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) - පක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිණිය** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) - පක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **කේ.ඒ ශාන්ත මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) - පක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **කේ.ඒ සංජීව මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) - පක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) - පක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **ජේ.ඒ ජයවර්ධන මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) - පක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) - පක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) - පක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **පී.ටී සිරිසේන මැතිතුමා** | **( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) - පක්ෂයි** |
| **ගරු මන්ත්‍රී** | **ඩී.පී බන්දුලසේන මැතිතුමා** | **( ශ්‍රී.ල නි.ප) - සභා ගර්භයේ නැත** |
| **ගරු මන්ත්‍රී** | **පී කරුණාරත්න මැතිතුමා** | **( ශ්‍රී.ල නි.ප) - සභා ගර්භයේ නැත** |

<u>ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා</u> 2021.11.05 දින පැවති විශේෂ මහ සභාවේ කෙටුම්පත් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2021.11.05 වන දින පැවති විශේෂ මහ සභා කෙටුම්පත් වාර්තාව ඉදිරිපත් වූ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමා</u> මෙවර 2022 අයවැය ඉදිරිපත් කිරීමට ප්‍රථම වසර ගණනාවක් ගරු සභාපතිතුමා විසින් කෙටුම්පත් සාකච්ඡාවක් පවත්වා සංශෝධන ලබා ගෙන එම සංශෝධන ඇතුලත් කරමින් සංශෝධිත අයවැය කෙටුම්පත සකස් කර එය සභා ගත කර සභා සම්මත කර ගත් නමුත් මෙවර කෙටුම්පත් සාකච්ඡාවේදීම අයවැය සම්මත කිරීම තුල සාකච්ඡාව සඳහා සහභාගී වීමට නොහැකි වූ ගරු සභිකවරුන් හට සිය අදහස් දැක්වීමට අවස්ථාව අහිමි වූ බැවින් අද දින ලබා දුන් සංශෝධිත අයවැය අධ්‍යයනය කිරීමට හා අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම සිදු කල යුතු බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මහජන නියෝජිතයෙකු ලෙස කෙටුම්පත සාකච්ඡා කිරීම සඳහා පැමිණෙන ලෙසට දැනුම් දී පැමිණ සිටි ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කල සංශෝධන සියල්ලක්ම පිළිගෙන අද වන විට සම්මත කරන ලද අයවැය ලේඛනය මෙලෙස ලබා දුන් බව සඳහන් කරන ලදී.

නැවතත් නැගී සිටි ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා සභාවේ පවතින නීත්‍යානුකූල නොවන තත්වය සම්බන්ධයෙන් කරුණු දැක්වීමට උත්සහ දැරීමේදී ඝෝෂාකාරි තත්වයක් ඇති වූ අතර ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා පෙ.ව 10.35 ට සභා ගර්භයෙන් පිටව යන ලදී.

**ආ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදනය**

**01. නිවාඩු දැනුම් දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය,ගරු මන්ත්‍රී එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා, ගරු මන්ත්‍රී ජී.ඒ නෙළුම් මැතිනිය මහ සභාවට නොපැමිණෙන බවට දන්වා යොමු කර තිබූ නිවාඩු ඉල්ලීම් මහ සභාවට නිවේදනය කරන ලදී.

තවද ගරු මන්ත්‍රී එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා කොවිඩ් වසංගත තත්වය හමුවේ නිරෝධායනයට ලක් වී ඇති බවට තමන් දැනුවත් කල බවද ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී සුභාෂිණී බණ්ඩාර මැතිණිය පනතේ සඳහන් පරිදී අඛණ්ඩව සභා වාර 03 ක් නොපැමිණීම මත සභික ධූරය අහෝසි වන බැවින් තමන්ද අතිශය වැදගත් කටයුත්තකට යාම පසෙක තබා මෙම සභා වාරයට සහභාගී වූ බවත්, ගරු මන්ත්‍රී එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමාගේ නොපැමිණීම තුල යම් ගැටළුවක් මතු විය හැකි බව සඳහන් කරන ලදී.

ගරු සභාපතිතුමා කරුණු දක්වමින් කියා සිටියේ ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූලතාවය සොයා බලා ක්‍රියාත්මක වන බවයි.

**02. ස්ථාවර තැම්පතු ගිණුම් ආරම්භ කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා පසුගිය දිනවල වෙන්දේසි කල වාහන වල ආදායම හා සභා අරමුදල් ගිණුමේ ලක්ෂ 05 ක් ගෙන ජාතික ඉතිරි කිරීමේ ගිණුමේ 7% පොලි ප්‍රතිශතය යටතේ රු 5,000,000 (ලක්ෂ පනහ) ක ස්ථාවර තැම්පතුවක්ද, LDSP ව්‍යාපෘතියට අයත් ගිණුමෙන් රු 10,000,000 (මිලියන දහය) ක ප්‍රමාණයක් ලංකා බැංකු අධිශ්‍රේණි ශාඛා ගිණුමේ 6% පොලි ප්‍රතිශතයක් යටතේ ද ස්ථාවර තැම්පතුවක්ද මාස 03 ක් සඳහා ආරම්භ කිරීමට සැළසුම් කර ඇති බව සභාවට නිවේදනය කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා PPTA ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුල උතුරු මැද පලාත් ප්‍රාදේශීය සභා අතරින් 1,2,3,4 ලෙසට ප්‍රමුඛතා ගත කර ඇති බවත්, ඒ තුල නැ.නු.ප ප්‍රාදේශීය සභාව 1 වන කාණ්ඩය යටතේ පැවති බැවින් රු 10,000,000 (මිලියන දහය) ප්‍රතිපාදන හිමි වීමට ඉඩ තිබූ නමුත් 33 ලකුණු ප්‍රමාණයක් පමණක් හිමි වීම මත අපට මෙලෙස 2 වන අධියරය සඳහා රු 3,300,000 (ලක්ෂ තිස්තුනක්) පමණක් හිමි වන බවත්, මෙය උතුරු මැද පළාතේ ප්‍රාදේශීය සභා අතරින් හිමි කර ගෙන ඇති අවම ලකුණු ප්‍රමාණය බවත්, සඳහන් කරන ලද අතර මේ සම්බන්ධයෙන් සභාව දැනුවත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා ගරු මන්ත්‍රී ඩී.පී බන්දුල සේන මැතිතුමා සඳහන් කල පරිදී පළමු වන අධියරය තුල පවතින සභාවක් අවම ලකුණු මට්ටමක් ලබා ගැනීම තුල පවතින හේතුව කුමක්ද යන්නත්, මේ සම්බන්ධයෙන් අප අවධානය යොමු කල යුතු බවත්, සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මේ සම්බන්ධයෙන් වාර්ථාවක් ඊළඟ මහ සභාවේදී ලබා දීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී.

**ඇ) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

**නැත.**

**ආ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

**නැත.**

**ඉ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01. 2021.11.05 වන දින විශේෂ මහ සභාවේදී සංශෝධනයන්ට යටත්ව සම්මත කරන ලද 2022 වර්ෂයේ අයවැය මහ සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2022 වර්ෂයේ අයවැය කෙටුම්පත සාකච්ඡා කිරීම සඳහා 2021.11.05 වන දින සභාවක් රැස් කර ඒ සඳහා පැමිණි ගරු මන්ත්‍රිතුමන්ලා වෙත සංශෝධන හෝ වෙනත් යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ඉඩකඩ ලබා දුන් අතර ගරු සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් ඉදිරිපත් වූ යෝජනා හා සංශෝධන සහිතව 2022 වර්ෂයේ කෙටුම්පත් අයවැය සංශෝධනයන්ට යටත්ව සම්මත කිරීම සුදුසු බවට අනුමැතියක් ලබා ගත් බැවින් ඒ සඳහා ඡන්දය විමසා 2022 කෙටුම්පත් අයවැය වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සම්මත වූ බවත්, එය අද දින මහ සභාවේ අනුමැතිය වෙනුවෙන් මෙලෙස යෝජනා තුලට ඇතුලත් කරන බව ප්‍රකාශ කරමින් 2021.11.05 වන දින විශේෂ මහ සභාවේදී සංශෝධනයන්ට යටත්ව සම්මත කරන ලද 2022 වර්ෂයේ අයවැය සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ගයාන් චාමර මැතිතුමා</u> 2021.11.05 වන දින විශේෂ මහ සභාවේදී සංශෝධනයන්ට යටත්ව සම්මත කරන ලද 2022 වර්ෂයේ අයවැය සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා</u> සම්මත කරන ලද අයවැය වාර්ථාව අප පිළි නොගන්නා බවත්. අයවැය තුල වැඩ ඒකකයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය ගල් රෝල් ආදී ප්‍රාග්ධන වියදම් කෙරේ අවධානය යොමු කිරීම සාධනීය කරුණු ලෙස දක්නට ලැබුනත්, ආදායම් උත්පාදනය සඳහා සිදු කර ඇති වෙන්කිරීම තුල මන්දගාමී ස්භාවයක් දක්නට ලැබෙන බවත්, තුරුළිය සෙවණ නිවාඩු නිකේතනය, ජයබිම උත්සව ශාලාව, කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානය , බිලොග් ගල් නිෂ්පාදන මධ්‍යස්ථානය යන ව්‍යාපෘති අතරින් එකඳු ව්‍යාපෘතියක්වත්, ලාභ ලැබීමේ අරමුණ ලගා කර ගැනීමට නොහැකි වී ඇති තත්වයේ තිබියදී සංචාරක බංගලාවක් ඉදි කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරීම කොපමණ දුරට සාර්ථක ද යන්නත්, වර්ථමානයේ කොවිඩ් වසංගත තත්වය හමුවේ අප සම්මත කරගෙන තිබූ ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් වන කිසිදු වෙන්කිරීමක් අයවැය තුල ඇතුලත් නොමැති වීම හා ආදායම් උත්පාදනය සම්බන්ධයෙන් කිසියම් ව්‍යාකූල තත්වයන්ද දක්නට ලැබෙන බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද සුභසාධනය වෙනුවෙන් ළමා , වැඩිහිටි, කාන්තා යන පාර්ශවයන් සඳහා වෙන් කල ඇති සංඛ්‍යා තුල ප්‍රමාණවත් බවක් නොමැති සේම කොරෝනා වසංගත තත්වය තුල කර ඇති වෙන්කිරීම් මොනවාද යන්නත්, එයද අවධානය යොමු කිරීමේදී ආදායම් උත්පාදනය හා සුභසාධනය යන අංශ වලින් අසාර්ථක අයවැයක් බව ප්‍රකාශ කරමින් අයවැය සම්මත කිරීමට විරුද්ධ බව ප්‍රකාශ කරමින් ඒ සඳහා බෙදීමක් අවශ්‍ය බව ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඒ අනුව සම්මත කිරීමට අදාල අයවැය 2022 වර්ෂය තුල ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු බවට ගෙන ආ යෝජනාව වෙනුවෙන් ඡන්දය විමසන ලෙස ලේකම්තුමා වෙත ප්‍රකාශ කරන ලදී.

අනතුරුව ලේකම්තුමා විසින් ඡන්දය විමසන ලද අතර යෝජනාවට පක්ෂව ඡන්ද 11 ක්ද විපක්ෂව ඡන්ද 06 ක්ද හිමි වූ අතර වැඩි ඡන්ද 05 කින් 2022 අයවැය වාර්ථාව 2022 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීම සුදුසු බවට වූ යෝජනාව සභා සම්මත විය.

| | | | |
|---|---|---|---|
| ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) | - පක්ෂයි |
| ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) | - පක්ෂයි |
| ගරු මන්ත්‍රී | බී.බී.ර් ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) | - පක්ෂයි |
| ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) | - පක්ෂයි |
| ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) | - පක්ෂයි |
| ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) | - පක්ෂයි |
| ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) | - පක්ෂයි |
| ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) | - පක්ෂයි |
| ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) | - පක්ෂයි |
| ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) | - පක්ෂයි |
| ගරු මන්ත්‍රී | ආර්.එම් කුමාරසිංහ මැතිතුමා | (එ.ජා.ප) | - සභා ගර්භයේ නැත |
| ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) | - විපක්ෂයි |
| ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය | ( එ.ජා.ප) | - විපක්ෂයි |
| ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණී බංඩාර මැතිනිය | ( එ.ජා.ප) | - විපක්ෂයි |
| ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) | - විපක්ෂයි |
| ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) | - විපක්ෂයි |
| ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) | - විපක්ෂයි |
| ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා | (ස්වාධීන කණ්ඩායම) | - පක්ෂයි |

**01.** **මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම.**

ගරු සභාපති එස්.බී. කුමාරදාස මැතිතුමා 2021.11.12 වන දින පැවති මුදල් කමිටුව මගින් ලබා ගත් පහත සඳහන් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**I. 2021 සංවර්ධන සැළැස්ම ක්‍රියාත්මක කිරීම.**

2021 සංවර්ධන සැළැස්මෙහි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යටතේ පුස්තකාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාල ඇස්තමේන්තුව මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ඉදිරිපත් කල ඇස්තමේන්තුව ප්‍රකාරව අදාල වැඩසටහන ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

II. **ප්‍රාදේශීය සභා කාර්යාලයේ ඇති වර්ණ මුද්‍රණ යන්ත්‍රය සඳහා තීන්ත මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභා කාර්යාලයේ ඇති වර්ණ මුද්‍රණ යන්ත්‍රය සඳහා තීන්ත මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් වර්ණ මුද්‍රණ යන්ත්‍රය සඳහා අවශ්‍ය තීන්ත වෙනුවෙන් අවම මිල ඉදිරිපත් කර ඇති අංක 09බී1/448, මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුර ලිපිනයේ පිහිටි වයිෆයි සෝන් කම්පියුටර් ටෙක්නොලජීස් (පුද්) සමාගම වෙතින් සම්පූර්ණ වටිනාකම 6,000.00 කට මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

### III. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ළහිරු ක්‍රීඩා පිටියට යාබදව පිහිටි මාර්ටින් වික්‍රමසිංහ මාවත දෙපස කාණු පද්ධතිය සැකසීම.

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ළහිරු ක්‍රීඩා පිටියට යාබදව පිහිටි මාර්ටින් වික්‍රමසිංහ මාවත දෙපස කාණු පද්ධතිය සකස් කිරීම සඳහා අවශ්‍ය හියුම් පයිප්ප මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් හියුම් පයිප්ප සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ජයන්ති මාවත, නව නගරය, අනුරාධපුර ලිපිනයේ පිහිටි සී/ ස නොර්ත් සෙන්ට්‍රල් කොන්ක්‍රීට් වර්ක්ස් (පුද්) සමාගම වෙතින් අවශ්‍ය හියුම් පයිප්ප සම්පූර්ණ වටිනාකම රු 437,750.00 මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

### IV. ප්‍රාදේශීය සභා කාර්යාලය සඳහා අවශ්‍ය විෂබීජ නාශක දියර යන්ත්‍ර මිල දී ගැනීම

ප්‍රාදේශීය සභා කාර්යාලය සඳහා අවශ්‍ය විෂබීජ නාශක දියර යන්ත්‍ර මිල දී ගැනීම වෙනුවෙන් කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර කැඳවන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති බලපිටිය, හොරණ ලිපිනයේ පිහිටි ඔන්ලයින් සොලියුෂන් වෙතින් ප්‍රාදේශීය සභා කාර්යාලය සඳහා අවශ්‍ය විෂබීජ නාශක දියර යන්ත්‍ර 02 ක් සම්පූර්ණ වටිනාකම රු 33, 000 කට මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය හිමි වන ලදී.

### V. ප්‍රාදේශීය සභා කාර්යාලයේ ඇති විදුලි ජනන යන්ත්‍රය වෙනුවෙන් අවශ්‍ය බැටරිය මිල දී ගැනීම

ප්‍රාදේශීය සභා කාර්යාලයේ ඇති විදුලි ජනන යන්ත්‍රය වෙනුවෙන් අවශ්‍ය බැටරිය මිල දී ගැනීම සඳහා කැඳවන ලද මිල ගණන් මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ඉදිරිපත් කරන ලද මිල ගණන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති අංක 2052/1,2,3, වීරසේකරාරාම පාර, අනුරාධපුර ලිපිනයේ පිහිටි මහනුවර ටයර් සෙන්ටර් වෙතින් විදුලි ජනන යන්ත්‍රය වෙනුවෙන් අවශ්‍යය Exide Power Battery 01 ක් සම්පූර්ණ වටිනාකම රු 9,500.00 කට මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

### VI. පොහොර නිෂ්පාදන මධ්‍යස්ථානය ඉදි කිරීම

280 තරියන්කුලම තුලානයේ කොම්පෝස්ට් පොහොර හා දියර පොහොර නිෂ්පාදන මධ්‍යස්ථානය ඉදි කිරීමට අදාලව

- කොම්පෝස්ට් නිෂ්පාදන ගොඩනැගිල්ල ඉදි කිරීම
- විදුලි සම්බන්ධතාවය ලබා ගැනීම
- ජල සම්බන්ධතාවය ලබා ගැනීම
- සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් ලබා ගැනීම

යන කරුණු වෙනුවෙන් සකස් කරන ලද රු 1,498,591.69 ඇස්තමේන්තුව මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව ප්‍රකාරව එම කොම්පෝස්ට් මධ්‍යස්ථානය ඉදි කිරීම කොන්ත්‍රාත් පදනමින් සිදු කිරීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා</u> 2021.10.08 වන දින මුදල් කමිටුව මගින් ලබා ගත් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> මුදල් කමිටු නිර්දේශ තුල මාර්ටින් වික්‍රමසිංහ මාවතේ කාණු පද්ධතිය සඳහා බෝක්කු මිල දී ගැනීම වෙනුවෙන් මිල ගණන් ඉදිරිපත් කර ඇති නමුත් පනත ප්‍රකාරව පෞද්ගලික නිවාස සඳහා ප්‍රවේශ වීම වෙනුවෙන් බෝක්කු ස්ථාපිත කිරීමේ හැකියාවක් නොමැති බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මාර්ගය අවට ජීවත් වන පුද්ගලයින් විසින් කරන ලද ඉල්ලීම ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීමෙන් අනතුරුව ආණ්ඩුකාරතුමාගේ නිර්දේශය මත පලාත් පාලන කොමසාරිස් තුමා පළාත් පලාන දෙපාර්තමේන්තුවේ මුදල් නොමැති බැවින් ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා ඉදි කර දෙන ලෙසට ප්‍රකාශ කර ඇති බැවින් මෙලෙස හියුම් පයිප්ප මිල දී ගන්නා බව ප්‍රකාශ කරන ලද අතර මාර්ගය පිළිසකර කිරීම නිසා ජනතාවට සිදු වී ඇති අපහසුතාවය මගහැරවීම හේතුකරගෙන මෙම හියුම් පයිප්ප ලබා දීමට තීරණය කරන ලද බවද සඳහන් කරන ලදී.

අනතුරුව ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා විසින් මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ගෙන ආ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකගතාවයෙන් සභා සම්මත විය.

**03. 2021 දෙසැම්බර් මස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021 දෙසැම්බර් මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා සභාවට ඉදිරිපත් කරමින් අදාල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**2021 දෙසැම්බර්**

| | | පැය ගණන |
|---|---|---|
| 01. එච්.එම්.එස්.ඩී චන්ද්‍රසිරි මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 02. එස්.එම් මහරගෙදර මිය | (සහකාර ගිණුම් නිළධාරී) | 60 |
| 03. අයි.ජී.සී.එන් වීරකෝන් මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 04. කේ.ජී.ඒ සම්මානි මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 05. කුමුදු වාසනා වීරසිංහ මිය | (කළ සහකාර (ආවරණ) | 60 |
| 06. ටී.එච්.ආර් තාරක මයා | (කළ සහකාර (ආවරණ) | 40 |
| 07. කේ.ජී.ජී.ඩී ගමගේ මිය | (පුස්තකාල සහායක) | 40 |
| 08. ඒ.ඒ පියතිස්ස මයා | (මා.කම්කරු (මුරකරු ආවරණ) | 40 |
| 09. ටී.එච්.ඩී.ඩී පෙරේරා මයා | (මුරකරු(ආවරණ) | 40 |
| 10. එම් ආර්.පෙරේරා මයා | (මුරකරු) | 75 |
| 11. එස් අන්තෝනි මයා | (මාර්ග කම්කරු) | 40 |
| 12. සුභාෂ් ගයාෂාන් මයා | (අනියම් රියදුරු) | 40 |
| 13. බන්දුල දිසානායක | (මුරකරු ආවරණ) | 75 |
| 14. ජේ.එම්.ජේ.ආර්.කේ ජයසුන්දර මයා | (විදුලි කාර්මික) | 40 |

ගරු මන්ත්‍රී ජේ.ඒ ඩී විමලසිරි මැතිතුමා 2021 දෙසැම්බර් මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ජයබිම උත්සව ශාලාව ඉදිරිපිට ජල පිරිපහදු මධ්‍යස්ථානයට ආසන්න වීථි ලාම්පුව අක්‍රිය තත්වයේ පවතින බව කිහිප අවස්ථාවකදීම තමා විසින් දැනුවත් කල නමුත් මෙතෙක් එය සිදු කර නොමැති බව සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අදාල වීථි ලාම්පුව කඩිනමින් අළුත්වැඩියා කිරීම සඳහා පියවර ගන්නා බව ප්‍රකාශ කරමින් අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සම්බන්ධව යම් විරෝධතාවයක් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2021 දෙසැම්බර් මස අතිකාල ඉල්ලුම්කල

සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

## 04. 2022 වර්ෂය සඳහා ස්ථානීය බදු දීම්

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශිය සභාවට අයත් වෙළඳ ඒකක 2022 වර්ෂයට බදු දිම සඳහා වාර්ෂිකව ටෙන්ඩර් කිරීමට නියමිත ස්ථාන හා භූමි සභාවට ඉදිරිපත් කරමින් ඉදිරිපත් කරන ලද අවම ලංසුව යටතේ ටෙන්ඩර් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| අනු අංකය | ස්ථානය හා අයිතමය | අවම ලංසුව |
|---|---|---|
| 01 | අතුරුවැල්ල එළ ගව මස් කඩය | 430,196.00 |
| 02 | කුඩා නෙළුබැව එළ ගව මස් කඩය | 78,600.00 |
| 03 | කුඩා නෙළුබැව පොල භූමියේ මුහුදු මාළු ලැල්ල | 17,114.00 |
| 04 | උණගස්වැව මංසන්ධියේ මුහුදු මාළු ලැල්ල | 25,000.00 |
| 05 | විජයපුර මංසන්ධිය වැව් මාළු ලැල්ල | 50,000.00 |
| 06 | ශ්‍රාවස්තිපුර මංසන්ධියේ මුහුදු මාළු ලැල්ල | 20,000.00 |
| 07 | නෙළුම්කුලම මංසන්ධියේ පොඩි ඇල අසල වැළු මාළු ලැල්ල | 20,000.00 |
| 08 | ආලංකුලම වැව ඉදිරිපිට වැව් මාළු ලැල්ල | 19,728.00 |
| 09 | කුඩා නෙළුබැව පොළ භූමියේ වැව් මාළු ලැල්ල | 16,858.00 |
| 10 | ප්‍රාදේශිය සභා මංසන්ධියේ මාළු ලැල්ල | 18,293.00 |
| 11 | කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානයේ මාළු ලැල්ල | 18,075.00 |
| 12 | පාලාඩිකුලම මංසන්ධියේ වැව් මාළු ලැල්ල | 30,000.00 |
| 13 | 5 ඇල මංසන්ධිය වැව් මාළු ලැල්ල | 20,485.00 |
| 14 | නාච්චාදූව මංසන්ධිය මාළු ලැල්ල | 15,187.00 |
| 15 | ඥාණික්කුලම 3 කණුව වංගුව අසල වැව් මාළු ලැල්ල | 18,075.00 |
| 16 | නෙළුම්කුලම මංසන්ධියේ මහ ඇල අසල මාළු ලැල්ල | 20,000.00 |
| 17 | මොරගොඩ අසල මාළු ලැල්ල | 18,050.00 |
| 18 | කුඩා නෙළුබැව ප්‍රාදේශිය රෝහල ඉදිරිපිට දියර කිරිහල | 23,022.00 |
| 19 | ජයබිම නිවාඩු නිකේතනය | 475,750.00 |
| 20 | නෙළුබැව උප කාර්යාලයේ ඇති ආපන ශාලාව | 18,000.00 |
| 21 | කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානයේ එළවළු වෙළඳ සැල | 120,000.00 |
| 22 | තුරුළිය සෙවන නිවාඩු නිකේතනය | ගිවිසුම පමණක් ඇතුලත් කෙරේ. |

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා 2022 වර්ෂය සඳහා ස්ථානීය බදු දීමේ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ප්‍රාදේශිය සභාවට අයත් වෙළඳ ඒකක 2022 වර්ෂයට බදු දීම සඳහා මීළ ගණන් කැඳවීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**05.** **හදිසි ඇඳිරි නීතිය නිසා වසා තැබූ කඩ කාමර හා දේපල බදු දී ඇති ස්ථාන වල බදු අය නොකරන ලෙසට කර ඇති ඉල්ලීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2020 වර්ෂයේදී මෙන්ම 2021 වර්ෂය තුල පැවති ඇඳිරි නීති කාලය තුල බල ප්‍රදේශයේ කඩ හා දේපල බදු ස්ථාන විවෘත කිරීමට නොහැකි වීම මත එම කාලය සඳහා බදු මුදල් ගෙවමින් නිදහස් කර දෙන ලෙසට ඉල්ලා සිටින බැවින් 2021 වර්ෂයේ මැයි මස හා ජුනි මස සඳහා බදු මුදල් නිදහස් කර දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ප්‍රායෝගික වශයෙන් වසා දැමුණු කඩ සම්බන්ධයෙන් නිසි පරීක්ෂාවක් සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

තවද ජයබිම උත්සව ශාලාව සත්‍ය ලෙසම ආදායමක් නොලැබූ බවට සහතික කල හැකි නමුත් අදාල භූමියේ නඩත්තු කටයුතු නිසි පරිදී නොකිරීම සම්බන්ධව කණගාටු වන සේම බදු කරුවන්ට හැකියාවක් නොමැති නම් සභා සේවකයින් යොදවා හෝ නඩත්තු කටයුත්ත සිදු කල යුතුව පැවති බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ. හැරිසෙන්ස් මැතිතුමා බදු දී ඇති ස්ථාන හැරුණු කොට මේ තුල වාර්ෂික වෙළඳ බලපත්‍ර හෝ ව්‍යාපාර බදු ගෙවන්නන් වෙත සහනයක් හිමි නොවන්නේද යන්න විමසන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා වාර්ෂික වෙළඳ බලපත්‍රය හෝ ව්‍යාපාර බද්ද ලබා ගැනීම සභාවට බදු මුදල් අය කරනවාට වඩා වෙළඳ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය කරුණක් බවත්, ඒ තුල පවතින්නේ වෙළඳ ව්‍යාපාරයේ නීත්‍යානුකූල තත්වය බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී සුභාෂිණි බණ්ඩාර මැතිණිය රජය මගින්ම සැලූන් හා බාබර් සාප්පු වසා දමන ලෙසට දැනුම් දී තිබූ සේම එම ව්‍යාපාරය වර්ෂය පුරාම වසා දැමීමට කටයුතු කිරීම තුල කිසිදු ආදායමක් නොලද බැවින් ඒ අයට පමණක් හෝ බදු සහනයක් ලබා දීමේ හැකියාව පවතීනම් වඩාත් හොඳ බවත්, බදු දී ඇති ව්‍යාපාර ස්ථාන වලින්ද මාස 02 ක් සඳහා නොව එක් මාසයක් සඳහා පමණක් බදු සහන ලබා දීම ප්‍රමාණවත් බව සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා වාර්ෂික වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු ගෙවීම සම්බන්ධයෙන් එලෙස සහන ලබා දීමේ හැකියාවක් නොමැති බව කරුණු දක්වමින් සඳහන් කරන ලද අතර, ක්‍රියාත්මක ව්‍යාපාරයක් බදු නොගෙවීම මත ව්‍යාපාරය පවත්වාගෙන යා නොහැකි බවද ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා සිදු වී තිබූ තත්වය තුල බල ප්‍රදේශයේ වෙළඳ ව්‍යාපාර මහත් අපහසුතාවයට ලක් වූ බැවින් 2021 වර්ෂයේ මැයි මස හා ජුනි මස සඳහා බදු මුදල් නිදහස් කර දීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් වූ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2021 වර්ෂයේ මැයි මස හා ජුනි මස සඳහා සභාවෙන් බදු පදනමින් ලබාගෙන ඇති ව්‍යාපාර වලින් බදු මුදල් නිදහස් කර දීමේ යෝජනාව සභා සම්මත වූ බව ප්‍රකාශ කළේය.

**06.** **ගලි බවුසරය සඳහා ගෙවූ මුදල් එම කාර්යය ඉටු නොකිරීම මත නැවත ගෙවීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අංක 360, අනුලාදේවි මාවත, අනුරාධපුර ලිපිනයේ පදිංචි ජේමසිරි හෙට්ටිආරච්චි යන අය විසින් 2021.10.22 වන දින 4722 දරණ ලදුපත් අංකයෙන් ගලි බවුසරය කුලියට ගැනීම වෙනුවන් රු 6526 ක් ගෙවීම් කර ඇතත් එම කාර්යයන් ඉටු නොකිරීම මත එම මුදල නැවත ඉල්ලීම් කර ඇති බව සඳහන් කර ආදායම් නැවත ගෙවීමට අදාල එල්.ජී 32 ආකෘති පත්‍රය සභා ගත කරන ලද අතර අදාල ස්ථානය වෙත සේවකයින් හා ගලිය පිටත්ව ගිය බැවින්, එම ගාස්තුව ප්‍රවාහන ගාස්තු, හා සේවක දිරි දීමනා අඩු කරගනිමින් නැවත ගෙවීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා අදාල කාර්යය ඉටු කිරීම සඳහා ප්‍රාදේශීය සභාව මගින් උත්සහ කර තිබුනත්, එය පස් තත්වයේ පවතින බැවින් සිදු කල නොහැකි වී ඇති නිසා අදාල කාර්යයට නියමිත ප්‍රවාහන ගාස්තුව හා සේවක දිරි දීමනාව අඩු කර ගනිමින් ඉතිරි මුදල ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ගලි බවුසරය වෙත මුදල් ගෙවූ නමුත් කාර්යය සිදු නොකිරීම මත ගෙවිය යුතු මුදල දිරි දීමනා හා ප්‍රවාහන ගාස්තු රඳවාගනිමින් නැවත ගෙවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා ශ්‍රාවස්තිපුර කොට්ඨාශයේ රාජපක්ෂ මාවත මීට පෙර අනුරාධපුර පාදෙනිය මාර්ගයේ සිට වීරවැව ප්‍රජා ශාලාව දක්වා ප්‍රතිසංස්කරණය කරන බවට මාර්ග සංවර්ධන අධිකාරය විසින් ගම් වාසීන්ට පොරොන්දුවක් දී තිබූ බැවින් ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ සංවර්ධනය කිරීමට යෝජිත යෝජනාව සම්බන්ධයෙන් සුදුසු වෙනත් මාර්ගයක් හෝ සංවර්ධනය කරන්නේ නම් සුදුසු බවට සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා පෙ.ව 11.30 සභා ගර්භයෙන් පිටව යන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා රාජපක්ෂ මාවත අනුරාධපුර පාදෙනිය මාර්ගයේ සිට වීරවැව ප්‍රජා ශාලාව දක්වා ප්‍රතිසංස්කරණය කිරීම අනිවාර්යෙන් සිදු කරන බවට ප්‍රකාශ කර ඇති බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා කුඩා නෙළුබැව සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය ඉදි කිරීම හා ගැටළුවක් පවතින බැවින් ඒ සම්බන්ධයෙන් පවතින වර්ථමාන තත්වය කෙබඳුද යන්නත් වන අලි ගැටළුව සම්බන්ධයෙන් විසඳුමක් ලෙස ගම් වැසියන් විසින් මේ සඳහා අඟලක් ස්ථාපිත කර එහි පස් මත වැට ඉදි කිරීමට සුදුසු බවට යෝජනා කර තිබූ නමුත් මේ හේතුව තුල වන අලි ප්‍රධාන මාර්ගයට පිවිස මිනිස් ජීවිත කිහිපයකට හානි පමුණුවා ඇති බවත්, මේ වන විට වන ජීවී දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය ලේකම් ද දිසාපතිතුමාගේ ද අනු දැනුමකින් තොරව වැට අසලින් අඟලක් කපා ගරු චන්ද්‍රසේන මැතිතුමා විසින් එය විවෘත කිරීමට කටුයුතු කල බවත්, මැතිවරණයට පෙර එතුමා විසින් එම භූමියේ සත්තු වත්තක් නිර්මාණය කරන බවට විශාල දැන්වීම් පුවරුවක් පවා ප්‍රදර්ශණය කල නමුත් මේ වන විට අදාල ප්‍රකාශය මෙන්ම දැන්වීම් පුවරුවද ඉවත් කර ගෙන ඇති බවත්, මේ වන විට ඉදි කරනු ලබන අඟලේ පස් විකිණීම සිදු කරන බවත්, එය අඩි 10 පළලින් හා අඩි 10 ක් ගැඹුරට හාරන බවත්, ගැටළුව ලෙසට පවතින්නේ මේ සියල්ල කිසිදු රාජ්‍ය ආයතනයක දැනුවත් භාවයකින් තොරව සිදු වීම බව ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා ගිය සතියේ ඉරිදා දිනයෙදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරීන්, භූ විද්‍යා හා පතල් කැණීම් අධ්‍යක්ෂ ජ'නරාල් හා වන ජීවී දෙපාර්තමේන්තු නිළධාරීන් කැඳවා වන අලි සම්බන්ධ ගැටළුව ගරු චන්ද්‍රසේන අමාත්‍යතුමා විසින් සාකච්ඡාවක් පැවැත්වූ බවත්, බල ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීම අනුව හා අලීන්ගෙන් වන තර්ජනය අවම කිරීම සඳහා මෙලෙස අගල් ඉදි කරන බැවින් ඒ තුල ගැටළු පවතින්නේ කෙසේද යන්න විමසන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා තමා වන ජීවී දෙපාර්තමේන්තුවෙන් විමසීමේදී මෙය ඔවුන්ගේ දැනුම සහිතව සිදු වන බවට දැනුම් දුන් නමුත් එහි සත්‍ය අසත්‍යතාවය නොදන්නා බැවින් මේ සම්බන්ධයෙන් වන ජීවී කාර්යාලයෙන් හා ප්‍රාදේශීය ලේකම් තුමන්ගෙන් විමසන බවත්, ඉදිරියේදී අදාල ස්ථානය තමා පරීක්ෂාව සඳහා යන අතර ඒ සඳහා ගරු මන්ත්‍රීතුමන්ලා සහභාගී වන ලෙසද සඳහන් කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා මොරගොඩ,තුරුවිල යන ප්‍රදේශවල පවතින වන අලි තර්ජනය වෙනුවෙන් 2021.01.25 මහ සභාව තුලදී ගෙන ආ යෝජනාව විසදිය යුතු කාර්යයක් වූවත්, වර්ථමානය වන විට මෙම අගල කැපීම සඳහා වන ජීවී කාර්යාලයේ මුදල් නොමැති බැවින් ස්වෙච්ඡාවෙන් අගල කැපීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති අයවළුන් හට භාර දීමට සූදානම් බව, තමන් විමසූ අවස්ථාවේ දී වන ජීවී කාර්යාලය විසින් ප්‍රකාශ කල බවත්, එහිදි එම කාරණය සඳහා තමන් විරුද්ධ වී එය ප්‍රාදේශීය සභාව වෙත පවරා දෙන ලෙසට ඉල්ලීම් කල බවත්, ඒ සම්බන්ධයෙන් ගරු එස්.එම් චන්ද්‍රසේන අමාත්‍යතුමා හා ගරු සභාපතිතුමා සමඟ සාකච්ඡා කල බවත්, කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව දැනුවත් නොකර අගල කැපීම සිදු කිරීම සම්බන්ධයෙන් කණගාටු වන බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා කිරික්කුලම තුලානයේ නොච්චියාගම හිටපු සභාපතිතුමා විසින් බොරළු කැණීම සිදු කර වන සංරක්ෂණයේ ඉඩම් විශාල ලෙස විනාශ කරමින් පවතින බවත්, මෙහිදී බලපත්‍රය සහිත ඉඩමට එහායින් වන සංරක්ෂණය සතු ඉඩම් වලින් බොරළු කැණීම සිදු කරන බවත්, මේ සඳහා එම කන්ද තුල වලවල් කිහිපයක් හාරා තිබෙන බැවින් ඒ තුල ජලය පිරී පහල සිටින ගොවීන්ගේ වගාවන් විනාශ වී යාමේ තර්ජනයක් මේ වන විට උද්ගත වී ඇති බවත්, සඳහන් කරන ලදී. තවද මේ සඳහා කමිටුවක් පත් කර ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කරන ලෙස ද ප්‍රකාශ කරන ලදී.

තවද මෙහි රාජ්‍ය නිළධාරීන් සමඟ එක් වී අක්කර ගණන් ඉඩම් සඳහා බලපත්‍ර සකස් කරගෙන ඉඩම් කට්ටි කර විකුණා විශාල ලෙස එම භූමියට හානි කර ඇති බව ද ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ ජයවර්ධන මැතිතුමා එම ප්‍රදේශයේ පෞද්ගලික මුදල් වියදම් කර අයිතියේ පවතින ඉඩම් පමණක් විකුණා ඇති බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා අදාල පෞද්ගලික ඉඩම් විකිණීම සිදු කර ඇති සේම ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා සඳහන් කල පරිදී අදාල ඉඩම් වලට බලපත්‍ර ලබාගෙන නිළධාරීන් පැමිණි පසු එම කොටස පෙන්වා මායිමට එහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් භූමියේද බොරළු කැණීම සිදු කරන බව සඳහන් කරන ලදී.

තවද ඉහල වැව, වැව් රක්ෂිතය ආසන්නයේ ඉඩමක් මිල දී ගත් පුද්ගලයෙකු වැව් රක්ෂිතයද අක්කරයක් පමණ අල්ලා වැට ඉදි කිරීමට කටයුතු කර තිබූ බවත්, ඒ සඳහා තමාද මැදිහත් වී අදාල භූමිය නිරාකරණය කිරීමට කටයුතු කල බවත්, මේ වන විටදී සම්පූර්ණයෙන්ම භූමිය කැණීම තහනම් කර ඇති බව සඳහන් කරන ලදී.

තව දුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා වසර ගණනාවක් පදිංචි වී සිටින පුද්ගලයෙකු ඉඩම් සඳහා බලපත්‍රයක් ලබා දෙන ලෙසට ප්‍රකාශ කිරීමේදී ඒ සඳහා දහසකුත් නීති ඉදිරිපත් කලත්, යම් ඉඩමක් කට්ටි කර විකිණීමේදී කිසිදු ගැටළුවක් ඇති නොවන බවත්, කිරික්කුලම පන්සල ආසන්නයේදී පසුගිය දිනවල අක්කර 02 ක පමණ ඉඩම් ප්‍රමාණයක් මෙලෙස කුට්ටි කර විකිණීමට කටයුතු කරමින් සිටි බවද ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා නාච්චාදූව ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය ඉදි කිරීම සම්බන්ධයෙන් විමසූ ගැටළුවට පිළිතුරු වශයෙන් තමා දැනට වසර 32 ක් පමණ නෙළුබැව නගරයේ ව්‍යාපාර කටයුතු සිදු කර ගෙන ගියත් මේ වන තෙක් වර්ථමාන ගරු සභාපතිතුමා මැදිහත් වී, සිටින ව්‍යාපාරිකයන් වෙත නීත්‍යානුකූලව ලබා දිය යුතුය යන අදහසේ සිට නාගරික සංවර්ධන අධිකාරිය, නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නැ.නු.ප ප්‍රාදේශීය සභාව ඇතුළු රාජ්‍ය ආයතන කිහිපයකම මැදිහත්වීම අරගෙන මෙම ව්‍යාපාරික ස්ථාන ඉදි කිරීම සුදුසු පරිදි කළමණාකරණය කර නීත්‍යානුකූල තත්වයට ගෙන ඇති නමුත්, වර්ථමානයේ නෙළුබැව ප්‍රාදේශීය රෝහලේ වෛද්‍යවරයා විසින්

වෙළඳ ව්‍යාපාර ඉදි කිරීමට ආරම්භ කිරීමෙන් පසු 1946 කෙටුම්පතකින් පැවරූ ඉඩමක මෙලෙස වෙළඳ ව්‍යාපාරය ඉදි කරන්නේ කෙසේද යන විරෝධතාවය දක්වා ඇති නමුත් මේ වන විට එලෙස වෙන් කර ඇති භූමිය වෛද්‍ය නිල නිවස ඉදි කර නීත්‍යානුකූලව පැවරීම සිදු කර ඇති බවත්, එතැනින් එහාට වෙනත් කිසිදු ආයතනයක මෙම කෙටුම්පත සම්බන්ධයෙන් නීත්‍යානුකූල තත්වයක් නොමැති මුත්, අදාල වෛද්‍යවරයා කිසිදු වගකීමකින් තොරව ඔහුගේ රාජකාරියෙන් බැහැර වී මෙම භූමියේ අයිතිය ගැන ප්‍රකාශ කරමින් තැන් තැන් වලට ගොස් විවිධ වැරදි අදහස් පල කරන බව සඳහන් කරන ලදී.

තවද මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්තුමා, පළාත් පාලන කොමසාරිස්තුමා, ගරු සභාපතිතුමා, ජනපද නිළධාරීන් තමා සමඟ වෛද්‍යවරුන් දෙපලද ඇතුළුව සාකච්ඡාවක් සිදු කල බවත්, එම අවස්ථාවේදී වෙළඳ ව්‍යාපාරයට අමතරව මෙම වෛද්‍ය කාර්යාලය ඉදි කිරීම සඳහා ඕනෑ තරම් ඉඩකඩ පවතින බවට සියළු දෙනා පිළිගත් බවත්, වෛද්‍යවරයාගේ නිල නිවාසය ආසන්නයේ පර්චස් 30 ක පමණ ප්‍රමාණයක පොල් වගා කර ඇති සේම මේ වන විට අදාල නිළ නිවාසය වෙනත් පාර්ශවයකට කුලියට ලබා දී ඇති බවටත් අදහස් දැක්වූ අවස්ථාවේ ඒ සම්බන්ධයෙන් ග්‍රාම නිළධාරීතුමා දැනුවත් කල බවට ප්‍රකාශ කල බවත්, එවැනි කිසිදු අවබෝධයක් නොමැති ප්‍රකාශ සිදු කරන මෙම වෛද්‍යවරයා කිසිම සීලාචාරකමකින් තොරව අනු දැනුමකින් තොරව නිළධාරීන්ට අනුගත නොවී වැරදි ප්‍රචාරයන් සිදු කරන බව සඳහන් කරන ලදී.

තවද මේ සම්බන්ධයෙන් සුදුසු පරීක්ෂාවක් සිදු කර මෙම ප්‍රාෙද්ශීය සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය ඉදි කිරීම සඳහා ඉඩකඩ ප්‍රමාණවත්ද යන්න නිගමනය කරන ලෙසත්, වෛද්‍යවරයා වෙත පවතින්නේ පෞද්ගලික කෝන්තරයක් බව වැඩිදුරටත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා</u> පැවති ගැටළුවේ යතාර්ථය වටහා ගැනීම වෙනුවෙන් අදාල කරුණු විමසූ බවත්, ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් ද මේ සම්බන්ධයෙන් කරුණු විමසූ අතර මීට ඉහතදී ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය ඉදි කිරීම සඳහා ශ්‍රාවස්තිපුර එක්තරා ඉඩමක කොටසක් ඉල්ලා තිබූ අතර එය ප්‍රදේශයට ලැබෙන සම්පතක් බැවින් වෙන් වූ ප්‍රතිපාදන තුලින් නිසි ප්‍රයෝජනයක් ගැනීම සඳහා ගරු සභාපතිතුමාද මැදිහත් වී ප්‍රාදේශීය ලේකම් සමඟ සුදුසු පියවරක් ගන්නා ලෙසත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> මේ වන විට 1946 වර්ෂයේ ලියන ලද අදාල කඩදාසියේ සිට මේ වන තෙක් වූ සිද්ධීන් සම්බන්ධ පැහැදිලි වාර්ථාවක් ලබා දෙන ලෙසට පළාත් පාලන කොමසාරිස්තුමා හා ප්‍රාදේශීය ලේකම්තුමා, ජනපද නිළධාරී වෙත දන්වා ඇති බවත්, ඒතුල වෙළඳ ව්‍යාපාරිකයන් සම්බන්ධ වාර්ථාවක්ද ඉල්ලා ඇති අතර මේ වන විට ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය ඉදි කිරීම තාවකාලිකව නතර කර ඇති නමුත් මෙම සම්පත නැති කර ගැනීමට සූදානම් නොමැති බවත්, රාජ්‍ය නිළධාරීන්ගේ උපදෙස් හෝ ඉල්ලීම් කිසිවක් නොතකා වෛද්‍යවරයා විසින් කරගෙන යන අනවශ්‍ය ක්‍රියාදාමය තුල මෙම ගැටළුව මතු වනවා විනා අදාල ඉදි කිරීම සම්බන්ධයෙන් හෝ භූමිය ලබා දීම සම්බන්ධව ප්‍රාදේශීය සභාවේ විරුද්ධත්වයක් නොමැති බව සඳහන් කරන ලදී.

**07. කොඩිගල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ශ්‍රාවස්තිපුර කොඩිගල මාර්ගය ජනවාරි මාසය වන විට කාපට් කිරීම ආරම්භ කිරීමට නියමිතව තිබුනා වුවත්, එම මාර්ගය මේ වන විට ගමන් කල නොහැකි තත්වයට අබලන් වී ඇති බැවින් ප්‍රාදේශීය සභාවේ ජේ.සී.බී යන්ත්‍රය හෝ යොදවා පස් ස්වල්පයක් අතුරා දෙන ලෙසට ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා හරහා ගම් වාසීන් ඉල්ලුම් කර ඇති බැවින් එම මාර්ගය තාවකාලිකව ගමන් කල හැකි පරිදි සහා යන්ත්‍ර සූත්‍ර භාවිතා කර සකස් කර දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා  මාර්ගය දෙපස කාණුව සකස් කල යුතු වන සේම මේ සඳහා මෝටර් ග්‍රේඩරය යොදා ගැනීමේ හැකියාව පවතීනම් වඩා සුදුසු බව සඳහන් කරන ලද අතර මාර්ගයේ කාණුව සකස් කිරීමේදී නිවාස වලට පිවිසෙන ප්‍රවේශ සකස් කිරීම කාණුව අවහිර නොවන සේ සකස් කර නොගන්නා ලෙසට අදාල මාර්ගයේ දෙපස පිරිස දැනුවත් කරන ලෙසද ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා නගර සභා මෝටර් ග්‍රේඩරය ලබා ගෙන එම මාර්ගය පමණක් නොව තවත් අබලන් මාර්ග මෝටර් ග්‍රේඩර් කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී.

**08.**

**ඊ) කාරක සභාවල වාර්තා**

- 2021 නොවැම්බර් මස 12 වන දින මුදල් කමිටු වාර්ථාව

**සභා ගත කරන ලදී.**

**එ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

2021 ඔක්තෝම්බර්  මස  ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

**ඒ) රැස්වීම් කැඳවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මහජන නියෝජිතයන්ගේ හැසිරීම තුල වඩා අවධානයෙන් කටයුතු කල යුතු බවත්, සිදු වූ ප්‍රායෝගික ගැටළු මත යම් යම් අතපසුවීම් සිදු වූවත්, එය ඉතාම ද්වේශ සහගත ලෙස හෙලා දැකීම කෙතරම් දුරට සාධාරණද යන්න වටහා ගන්නා ලෙස ප්‍රකාශ කරන ලද අතර 2022 අයවැය සම්මත කරන විශේෂ මහ සභාව සඳහා සාධාරණ හේතු මත නොපැමිණි ගරු මහජන නියෝජිතයන්ට වඩා අසාධාරණ හේතු මත සභාව වර්ජනය කරන අදහසින්ම නොපැමිණි ගරු මන්ත්‍රීවරුන් සම්බන්ධව දැඩි ලෙස කණගාටු වන බව ප්‍රකාශ කරමින්  බල ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් ගෞරවයෙන්  සහයෝගය දැක්වූ ගරු මන්ත්‍රීතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත ස්තූතිය ප්‍රකාශ කරමින් 2021.11.23  වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 12.15 ට අවසන් කරන ලද අතර එළබෙන මහ සභාව 2021.12.21 වන දින පෙ.ව 10.00 පැවැත්වෙන බව සඳහන් කරන ලදී.

| | |
|---|---|
| ................................... | ......................................... |
| බී.එච් ප්‍රදීප් නිශාන්ත, | එස්.බී කුමාරදාස, |
| ලේකම්, | සභාපති , |
| නැ.නු.ප ප්‍රාදේශීය සභාව, | නැ.නු.ප්‍රාදේශීය සභාව, |
| විජයපුර. | විජයපුර. |